# EXECUTIVE SUMMARY

## විධායක සාරාංශය

DRAFT COPY
FOR NATIONAL CONSULTATIONS

**පසුබිම**

2009 අප්‍රේල් මස බෙංගාල බොක්ක විශාල සමුද්‍ර පරිසර පද්ධතිය පිළිබඳ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

ශ්‍රී ලංකාව, ඉන්දියාව, ඉන්දුනීසියාව, බංගලාදේශය, මියන්මාරය සහ මාලදිවයින සහභාගිත්වයෙන් බෙංගාල බොක්ක සමුද්‍ර පරිසර පද්ධතිය සහ එහි ධීවර සම්පත් කලාපීය කළමනාකරණය තුළින් ඉහළ නංවා වෙරළබඩ ප්‍රජාවගේ ජීවන තත්වය උසස් කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ.

බෙංගාල බොක්ක විශාල සමුද්‍ර පරිසර පද්ධති ව්‍යාපෘතියට අදාළ රාජ්‍යයන්හි ඒකාබද්ධ මුළු ජනගහනය බිලියන 1.7 කි. මෙම ප්‍රමාණය මුළු ලෝක ජනගහනයෙන් 25% වන අතර එයට මිලියන 450 ක වෙරළබඩ ප්‍රජාවක් අයත් වේ. මෙම කලාපය විශාල ප්‍රමාණයේ ඛණිජ සහ බලශක්ති සම්පත් ප්‍රධාන ධීවර කර්මාන්තයට උපකාරී වන සමුද්‍රික ජීවී සම්පත් සහ වන සහ භූමි සම්පත් වලින් සමන්විත ස්වාභාවික සම්පත් වලින් පොහොසත් වේ. වර්තමාන ධීවර නිෂ්පාදනය වසරකට ටොන් මිලියන 6 ක් වන අතර එය මුළු ලෝක මුහුදු ධීවර අස්වැන්නෙන් 16% ක් වේ.

මෙම විශාල සමුද්‍ර පරිසර පද්ධතිය කඩොලාන (ලෝක කඩොලානවලින් 12% පමණ කඩොලාන) කොරල්පර (ලොව කොරල්පර වලින් 8% පමණ) සහ මුහුදු තෘණ ඇතුළත් පරිසර පද්ධතීන්ගේ පැවැත්මට උපකාරී වේ. මෙම ප්‍රදේශය ඉහළ ජෛව විවිධත්වයෙන් යුතු අතර එය තර්ජනයට ලක් වූ සහ අනතුරට ලක්විය හැකි විශේෂයන් සමූහයකගෙන් යුක්ත වේ.



මෙම විශාල සමුද්‍ර පරිසර පද්ධතිය සහ එහි ස්වාභාවික සම්පත් එයට මායිම්ව පිහිටි රටවල සමාජීය සහ ආර්ථිකයට ඉතා වැදගත් වේ. ධීවර කටයුතු, මුහුදු වගාවන්, සංචාරක කටයුතු සහ නාවික වැනි කටයුතු, ආහාර සුරක්ෂිතතාව, සේවා නියුක්තියට සහ ජාතික ආර්ථිකයන්ට දායක වේ.

ලොව වෙරළබඩ දුගී ප්‍රජාවගෙන් 50% බෙංගාල බොක්ක විශාල පරිසර පද්ධතියට අයත් රටවල වාසය කරයි. මිනිසුන් බිලියන ගණනකගේ ජීවනෝපායක් ලෙස ජීවී සාගර සම්පත්, විශේෂයෙන් ආහාර මූලයක් ලෙසත් ඉතා වැදගත් වේ. මෙම විශාල සමුද්‍ර පරිසර පද්ධතිය තුළ ධීවර යාත්‍රා 400,000 (යාන්ත්‍රික සහ යාන්ත්‍රික නොවන) ක් පමණ ක්‍රියාත්මක වන අතර ධීවර හා ධීවර කටයුතු වලට අදාළ ක්‍රියාකාරකම් හි මිලියන 4.5 පමණ සේවාවන්හි නියැලේ. සීඝ්‍ර ජනගහන වර්ධනය, ආහාර, ජීවනෝපායන් සහ වාණිජ කටයුතු සඳහා ජලජීවී සම්පත් කෙරෙහි පවත්නා දැඩි රුඬියාව මෙන්ම අධික ලෙස ඉඩම් පරිහරණය සමුද්‍ර පරිසර පද්ධතිය කෙරෙහි දැඩි බලපෑමක් ඇති කොට ඇත.

මෙහි ප්‍රතිඵලයක් ලෙස සම්පත් ප්‍රයෝජනයට ගන්නා වෙරළබඩ දුගී ප්‍රජාව ඇතුළු විශාල පිරිසකගේ අපේක්ෂාවන් ඉටු කිරීම සඳහා බෙංගාල බොක්ක කෙතෙක් දුරට උපකාරී වේ දැයි සැක පහළ වී ඇත.

**විශාල සමුද්‍ර පරිසර පද්ධතිය පිළිබඳ පොදු ගැටළු විනිශ්චය විශ්ලේෂණය**

බෙංගාල බොක්ක විශාල සමුද්‍ර පරිසර පද්ධතිය පිළිබඳ ගැටළු විනිශ්චය විශ්ලේෂණ වාර්තාව වසර 7 ක පමණ වූ විශාල වැඩ කොටසක ප්‍රතිඵලයකි.

මෙම ගැටළු විනිශ්චය විශ්ලේෂණය මඟින් කලාපීය වශයෙන් ජලය හා සම්බන්ධිත පොදු ගැටළු සහ ඒවායේ හේතු හඳුනා ගැනීමත් ගණනය කිරීමත් ප්‍රමුඛතා මත පෙළගැස්සීමත් ඒවායේ සමාජ ආර්ථික සහ පාරිසරික බලපෑමත් මත ඉදිරිපත් කරනු ලබයි.

විවිධ අධ්‍යනයන් කලාපීය සහ ජාතික මට්ටමෙන් පාර්ශවකරුවන්ගේ අදහස් විමසීමත් ඇතුළත් වසර 7 ක ක්‍රියාකාරකම් හි ප්‍රතිඵලයක් ලෙස පොදු ගැටළු විනිශ්චය විශ්ලේෂණය වාර්තාව එළි දැක ඇත.

පවත්නා ගැටළු හා ඒවායේ හේතු පිළිබඳව කටයුතු කිරීමට ජාතික හා කලාපීය වශයෙන් සම්බන්ධීකරණ ක්‍රියාකාරකම් අඩංගු ක්‍රමෝපායික ක්‍රියාකාරකම් වැඩසටහන් සහයෝගිත්ව පදනම මත සකස් කිරීම සඳහා මෙම පොදු ගැටළු විනිශ්චය විශ්ලේෂණ වාර්තාව මඟින් විද්‍යාත්මක පදනමක් ලබා දේ.



## පොදු ගැටළු විනිශ්චය විශ්ලේෂණ වාර්තාව අවධානයට ලක් වූ ප්‍රධාන ක්ෂේත්‍ර 3 ක් හඳුනා ගනී.

1. ප්‍රමාණය ඉක්මවා සමුද්‍රික ජීවී සම්පත් නෙලා ගැනීම.
2. කොරල්පර මුහුදු තෘණ සහ කඩොලාන හායනය.
3. පරිසර දූෂණය.

මෙම ක්ෂේත්‍ර 3 පිළිබඳ හේතු ඵල විශ්ලේෂණයක් පවත්වා ඇති අතර එමගින් අවධානයට ලක් වූ එක් එක් ක්ෂේත්‍රයේ ප්‍රමුඛ ගැටළු සහ ඒවාට හේතුපාදක වූ කරුණු හඳුනා ගෙන ඇත. පොදු ගැටළු නිර්ණ විශ්ලේෂණ වාර්තාවේ සාරාංශයක් පහතින් දක්වා ඇත.

ජාතික වශයෙන් වැදගත් සමහර ගැටළු මේ යටතේ දක්වා නොමැති බව සඳහන් කළ යුතුව ඇත. මේ යටතේ දක්වා ඇති පොදු ගැටළු අර්ථකථනය කොට ඇත්තේ යම් පාරිසරික ගැටළුවකට බලපානු ලබන හේතු හෝ / සහ එහි බලපෑම ජාතික සීමාවකින් වෙන් වී ඇත්නම් හෝ ගෝලීය පාරිසරික ගැටළුවකට දායක ඒ සඳහා කලාපීය වශයෙන් දෙනු ලබන විසඳුම් ගෝලීය පාරිසරික ප්‍රතිලාභ ජනිත කිරීමට ඉවහල් වනු බලන්නකි.

බෙංගාල බොක්ක විශාල සමුද්‍ර පරිසර පද්ධතියේ අදාළ ගැටළුවලට බලපෑම් ඇති කරන සමාජ ආර්ථික, ආයතනික, නෛතික, පරිපාලන සහ දේශගුණික වෙනස්වීම යන ප්‍රධාන සාධකයන් ද පොදු ගැටළු විනිශ්චය විශ්ලේෂණය මඟින් විමර්ශනය කරනු ලබයි. අවධානයට ලක් වූ ප්‍රධාන ක්ෂේත්‍රයන් තුන පිළිබඳව ක්‍රියාත්මකවන කටයුතුවල සාර්ථකත්වයට ඉහත බලපෑම් බාධක හෝ අභියෝගයන් එල්ල කරනු ඇත.

“ක්‍රමෝපායික ක්‍රියාකාරකම් සැලැස්ම” සැකසීමේදී මෙම තොරතුරු වැදගත් වනු ඇත.



## ප්‍රමාණය ඉක්මවා ජීවී සමුද්‍ර සම්පත් නෙලා ගැනීම

### ප්‍රධාන ගැටළු

- මූලික වශයෙන් ධීවර සම්පත් වල පැවැත්ම පහත බැසීම.
- අල්ලනු ලබන මත්ස්‍ය අස්වැන්නේ විශේෂයන්ගේ සංයුතිය වෙනස් වීම.
- අල්ලා ගනු ලබන මත්ස්‍ය අස්වැන්නේ කුඩා මත්ස්‍යයින් බහුලව තිබීම.
- තර්ජනයට ලක් වූ සහ අනතුරට ලක්විය හැකි විශේෂයන් ක්ෂය වීම තුළින් සමුද්‍ර ජෛව විවිධත්වය වෙනස් වීම.

### ප්‍රධාන ගැටළුවල පොදු ස්වාභාවය

- මුහුදු සීමා හරහා මත්ස්‍යයින් හා මත්ස්‍ය පැටවුන් සංක්‍රමණය විම තුළින් බොහෝ මත්ස්‍ය සම්පත් බෙංගාල බොක්ක විශාල සමුද්‍ර පරිසර පද්ධතියට අයත් රටවලට පොදුවේ.
- නීත්‍යානුකූලව සහ අනවසර අයුරු දෙකෙන්ම එම රටවල්වලට ඔබ්බෙන් මසුන් මැරීම – එක් ස්ථානයක යුත්‍රා ප්‍රමාණය ඉක්මවා තිබීම හා ප්‍රමාණය ඉක්මවා මසුන් මැරීම තුළින් ධීවරයින් හා යාත්‍රා වෙනත් ස්ථානයට සංක්‍රමණය කිරීම සිදුවේ.
- විශේෂයෙන් පරිසර පද්ධති ප්‍රවේශය සහිත ධීවර සම්පත් කළමනාකරණය ක්‍රියාත්මක කිරීමේදී සියළු රටවල් (අඩු හෝ වැඩි මට්ටමින්) බාධාවන්ට මුහුණ දීම.
- ගෝලීය වශයෙන් පවත්නා තර්ජනයට ලක් වූ සහ අස්ථායි විශේෂයන් වඳ වී යාම කෙරෙහි බෙංගාල බොක්ක සමුද්‍ර පරිසර පද්ධතියට අයත් රටවල් දායක වීම.

### ගැටළු වලට හේතු වූ මූල සාධක

- විවෘත පිවිසුම් ස්වාභාවය.
- මසුන් ඇල්ලීමේ ප්‍රයත්නය ඉහළ යාම- විශේෂයෙන් හැඹිලි දැල් හා ට්‍රෝලර් මගින්
- ජලජීවී වගාව සඳහා බිජ, ආහාර සැපයුම ඇතුළුව මත්ස්‍ය නිෂ්පාදන සඳහා පවත්නා අධි ඉල්ලුම .
- දුර්වල සෝදිසි මෙහෙයුම් සහ නීති ක්‍රියාත්මක කිරීම.
- වඩාත් උසස් ප්‍රතිලාභ සහිත ප්‍රදේශයන් වෙත ඇතුළු වීම සඳහා ප්‍රබල දිරිගැන්වීම් පැවතීම.



## පරිසර වාසභූමි හායනය

### ප්‍රධාන ගැටළු

1. කඩොලාන සම්පත් නැතිවීම සහ ක්ෂය වීම.
2. කොරල්පර හායනය.
3. මුහුදු තෘණ නැති වීම සහ ක්ෂය වීම.

### ප්‍රධාන ගැටළුවල පොදු ස්වාභාවය

- බෙංගාල බොක්ක විශාල සමුද්‍ර පරිසර පද්ධතියට අයත් සියළු රටවල මෙම ප්‍රධාන පරිසර වාසභූමි 03 පිහිටා ඇත.
- වෙරළබඩ සංවර්ධන කටයුතු සඳහා භූමිය සහ මුහුද භාවිතා කිරීම බෙංගාල බොක්ක විශාල සමුද්‍ර පරිසර පද්ධතියට අයත් සියළු සංවර්ධනය වෙමින් පවත්නා රටවලට පොදුවූවකි.
- දේශගුණික වෙනස්වීම් හේතු කොට ඇතිවන බලපෑම් බෙංගාල බොක්ක විශාල සමුද්‍ර පරිසර පද්ධතියට අයත් සියළු රටවල් වලට පොදු වේ.
- පරිසර වාසභූමි මත පදනම් වූ සියළුම නිෂ්පාදන සඳහා වෙළඳාම පොදු ස්වභාවයක් ගනී

### ගැටළු සඳහා බලපානු ලබන මූල සාධක

- දුගී ජනයාගේ ආහාර සුරක්ෂිතතාව පිළිබඳ අවශ්‍යතා
- ජාතික ප්‍රාදේශීය සහ පළාත්සභා මට්ටමේ වෙරළබඩ සංවර්ධන සැලසුම් නොමැතිවීම
- පරිසර වාසභූමි හා බැඳුනු නිෂ්පාදන සඳහා වූ වෙළඳාම (දේශීය හා අපනයන) ඉහළ යාම
- වෙරළබඩ සංවර්ධනය සහ කාර්මීකරණය
- ප්‍රතිඵලදායක නොවූ සමුද්‍ර ආරක්ෂිත ප්‍රදේශ සහ නීති ක්‍රියාත්මක කිරීම දුර්වලවීම
- ගංගාවල ඉහළ කොටස්වල කරනු ලබන තීව්‍ර කෘෂිකාර්මික කටයුතු
- සංචාරක කටයුතු වර්ධනය
- දේශගුණික වෙනස්වීම



## පරිසර දූෂණය

### ප්‍රධාන ගැටළු

1. මල ද්‍රව්‍ය පාදක රෝගකාරක විෂබීජ සහ කාබනික තොග
2. ඝන අපද්‍රව්‍ය / සාගර ආශ්‍රිත කසල
3. පෝෂක යෙදවුම් ඉහළ යාම
4. තෙල් දූෂණය
5. දිගුකල් පවතින කාබනික දූෂණක සහ විෂ මූලක ද්‍රව්‍ය
6. රොන්මඩ
7. බැරලෝහ

### ප්‍රධාන ගැටළුවල පොදු ස්වාභාවය

- පිරිපහදු නොකරන ලද සහ අර්ධ ලෙස පිරිපහදු කරන ලද මල ද්‍රව්‍ය මුදා හැරීම. ගංගා/ බ්‍රහමපුත්‍ර / මෙගානා පද්ධතියෙන් මලද්‍රව්‍ය සහ කාබනික ද්‍රව්‍ය මුදා හැරීම පොදු ස්වාභාවයක් ගනී.
- ප්ලාස්ටික් සහ ධීවර ආම්පන්න අබලි ද්‍රව්‍ය ජාතික මුහුදු සීමාවන් හරහා බොහෝ දුර ප්‍රවාහනය වීම.
- ගංගා මගින් විශාල ලෙස මුදා හරින පෝෂක ද්‍රව්‍යයන් විශාල පරිමාණයෙන් ඔක්සිජන් අවම කිරීමට ඉවහල් විය හැක. වායුගෝලය හරහා පෝෂක ද්‍රව්‍ය ප්‍රවාහනය නිරන්තරවම රටවල් අතර වූ පොදු ගැටළු වේ.
- නැව් වලින් මුදාහරිනු ලබන අපජලය/ ද්‍රව්‍ය අදාල රෙගුලාසි හා නීති ක්‍රියාත්මක කිරීම පිළිබඳ රටවල් අතර පත්නා වෙනස්කම් හේතුකොට එම මුදාහැරීම් දේශ සීමාවන් හරහා ගමන් කරයි – දැව් තෙල් වලින් නිර්මිත තාර බෝල බොහෝ දුර ප්‍රවාහනය වේ
- දිගුකල් පවත්නා කාබනික දූෂක (POPs) / නොනැසී පවතින විෂ මූලක ද්‍රව්‍ය සහ රසදිය දුරදිග ප්‍රවාහනයට වේ.
- රොන්මඩ සහ බොහෝ බැරලෝහ මුසුවීම් දේශීය වශයෙන් සීමාවීමට ඉඩකඩ ඇති අතර එය රටවල් අතර පවත්නා ගැටළුවක් ලෙස විද්‍යාමාන වීම අවම මට්ටමක පවතී.

### ගැටළු සඳහා වූ මූල සාධක

- නාගරිකරණය සහ වෙරළබඩ ජන ඝනත්වය ඉහළ යාම.
- ඒක පුද්ගල පරිභෝජනය ඉහළ යාම.
- බෙංගාල බොක්ක විශාල සාගර සමුද්‍ර පරිසර පද්ධතියට අදාල රටවල කර්මාන්ත ස්ථානගත වීම (සංක්‍රමණය වීම) සහ කුඩා කර්මාන්ත විසිරීම.
- පහළ මට්ටමක පවත්නා දළ දේශීය නිෂ්පාදිතය.